# ඇබෑර්තු

# ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු බඳවා ගැනීම

## මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා (MORBDP)

## වාරිමාර්ග අමාත්‍යාංශය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 හා රජයේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ප්‍රකාරව "කොන්ත්‍රාත් පදනමින්" ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම සඳහා, සුදුසුකම්ලත් හා කැපවී සේවය කළ හැකි ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට නොවැඩි විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය සහ රජයේ රෙගුලාසිවල හුරුපුරුදුතාවය මෙන්ම පරිගණක සාක්ෂරතාවය සතුවීම අත්‍යවශ්‍ය පූර්වාව්‍යතාවය වේ. ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල කාර්ය පළපුරුද්ද සතුවීම අමතර වාසිදයක වනු ඇත.

**සේවා ස්ථානය : වැලිකන්ද, පොළොන්නරුව, PMU කාර්යාලය**

## 01. ව්‍යාපෘති අධ්‍යක්ෂ - තනතුර 01

වැටුප් තලය - PS1- රුපියල් 180,000.00 - 200,000.00

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද (පහත I හෝ II හෝ III)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම් සමග අවම වශයෙන්, කළමනාකරණ තලයේ සුදුසුකම් ලැබීමෙන් පසු වසර 14 ක පළපුරුද්ද.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන පිළිගත් වෙනත් සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීන් සුදුසුකම් සහ පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සමග අවම වශයෙන් කළමනාකරණ තලයේ, සුදුසුකම් ලැබීමෙන් පසු වසර 12 ක පළපුරුද්ද

iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම් සමග අවම වශයෙන් කළමනාකරණ තලයේ වසර 10 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අයදුම්පත්**

අයදුම්කරුවන් විසින්, තම ජීවදත්ත හා අධ්‍යාපනික වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළත්ව ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සහිතව අයදුම්පත් යොමු කළ යුතුවේ. ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරුණු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, තෝරා ගැනීම කුසලතා මත පදනම්ව සිදු කෙරේ. ව්‍යාපෘතිවල පූර්ව පළපුරුද්ද සහිත අවශ්‍ය පරිදි සුදුසුකම් සහිත අයදුම්කරුවන් හට ප්‍රමුඛස්ථානය හිමිවේ. මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල පිටපත් අයදුම්පත් සමග අමුණා තිබිය යුතු අතර, සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

රජයේ ආයතනවල / අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත්, එක් එක් ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2021.12.17 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය,**
**10 වන මහල, අංක 500, ටී. බී ජයා මාවත,**
**කොළඹ 10.**